සාමාන්‍ය සමය විසිදෙවන ඉරුදින

# දේව ප්‍රකාශන

02-09-12

## පළමුවන කියැවීම

ද්වීතීය නීති සංග්‍රහය 4:1-2, 6-8

ද්වීතීය නීති සංග්‍රහයෙන් ගත් පාඨයෙකි.

**මා ඔබට උගන්වන නීති හා නියෝගයන්ට අමතර වචන එකතු නොකර ඒවා පිළිපැදිය යුතු ය.**

මෝසෙස් ඉශ්රායෙල්වරුන්ට කථා කොට මෙසේ කීය. “ඔබේ පියවරුන්ගේ දෙවි සමිඳුණන් වහන්සේ ඔබට දෙන්නට යන දේශයට ඇතුල් වී, එය අයිති කරගෙන, එහි ජීවත් වන පිණිස ඔබ විසින් ඉටු කළ යුතු මා ඔබට උගන්වන නීති හා නියෝගයන්ට ඉශ්රායෙල්වරුනි, දැන් ඉතින් සවන් දෙන්න. මා ඔබට අණ කළ ඔබේ දෙවි සමිඳුණන් වහන්සේගේ නීති හා නියෝගවලට අමතර වචනයක් එකතු නොකර, ඒවායින් කිසිවක් අඩු නොකර, ඔබ ඒවා පිළිපැදිය යුතු ය. ඒවා ආරක්ෂා කරමින් පිළිපදින්න. මෙසේ කිරීමෙන් සෙසු ජාතීන් ඉදිරියෙහි ඔබේ පැණවත්කමත් නැණවත්කමත් තැපී පෙනෙනු ඇත. මේ නීති සියල්ල ගැන ඔවුන්ට සැල වන විට මේ ශ්‍රේෂ්ඨ ජාතියට අයිත් සෙනග කොතරම් නැණවත් ද පැණවත් ද කියා ඔවුන් විස්මපත් වනු ඇත. අපේ දෙවි සමිඳුණන් වහන්සේගෙන් අප අයදින සියල්ලෙහි දී, උන් වහන්සේ අපට ළංව සිටින්නාක් මෙන්, වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියකට දෙවි කෙනෙක් ළංව සිටින්නේ ද? මා අද දින ඔබ ඉදිරියෙහි තැබූ මේ සියලු නීති මෙන් සාධාරණ නීති හා නියෝග වෙන කිනම් ශ්‍රේෂ්ඨ ජාතියක් සතුව පවතී ද?

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 15:1-5

පිළිතුර: සමිඳුනි, දැහැමියා ඔබ අභියස සිටින්නේ ය.

ගීය: සමිඳුනි, ඔබේ දෙව් මැඳුරෙහි කවරෙකුට සිටිය හැක්කේ ද? ඔබේ ශුද්ධ කන්දේ කවරෙකුට විසිය හැක්කේ ද? නිදෙස් ලෙස කල් යවන දැහැමි ලෙස වැඩ කරන, අවංක වදන් පවසන තැනැත්තාට ය.

ගතු කේලාම් නොකියන, මිතුරාට නපුර නොකරන, අසල්වැසියාට එරෙහි ව කට කතා නොපතුරුවන තැනැත්තාට ය.

ඔහු දුදනන් පිළිකුල් කරන්නේ ය. සමිඳුන්ට ගරු කරන අයට ඔහු ගරු සරු පා වාසි අවාසි නොතකා, සිය පොරොන්දු ඉටු කරයි. ඔහු මුදල් පොළියට නොදෙයි. නිදෙස් අයට විරුද්ධ ව අල්ලස් නොගන්නේ ය. මෙවන් ගුණැති මිනිසා හට පිරිහීමක් කිසි කලෙක නොවන්නේ ය.

## දෙවන කියැවීම

ජාකොබ් 1: 17-18, 21-22. 27

ශුද්ධ වූ ජාකොබ් තුමන්ගේ හසුනෙන් උපුටා ගත් කොටසකි.

**දහම් පණිවුඩය පිළිපදින්නන් වන්න.**

සැම යහපත් දීමනා ද සියලු අගනා ත්‍යාග ද නොවෙනස් වන සුළු, පහව යන බවට ඡායා මාත්‍රයකුදු නැති ආලෝකයේ පියාණන් වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේ ය. උන් වහන්සේ මැවූ සත්වයන් අතර අප මුදුන් මල්කඩ වීමේ පෙර ලකුණු වශයෙන්, අප ජනිත කළ සේක. එහෙයින් සියලු අධම දෙය ද දමනය කළ නොහැකි

දුෂ්ටකම් ද ඉවත ලා ඔබට ගැලවීම සාදා දිය හැකි ඔබ සිත් සතන්හි මුල් බැස ගත් දහම් පණිවුඩය යටහත් ලෙස පිළිගන්න. එහෙත්, තමන් ම රවටා නොගෙන දහම් පණිවුඩය අසන්නන් පමනක් නොවී, එය පිළිපදින්නෝ වන්න. අපගේ පියාණන් වන දෙවියන් වහන්සේ ඉදිරියෙහි පිරිසිදු නිර්මල භක්තිය නම්, මව්පියන් නැති දරුවන්ට ද වැන්දඹුවන්ට ද ඔවුන්ගේ විපත්තිවල දී පිහිට වීමත්, ලෝකයෙන් තමා ම කිළුටු නොවී ආරක්ෂා වීමත් ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ජුවාම් 6:63,68

ආලේලූයා! ආලේලූයා!

"මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි."

සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය.

ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 7:1-8, 14-15, 21-23

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**" ඔබ දෙවියන් වහන්සේගේ ආඥාව ඉවත ලා, මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන් පිළිපදින්නහු ය."**

තවද, ජෙරුසලමෙන් පරිසිවරු ඇතැම් විනයධරයන් හා සමඟ ජේසුස් වහන්සේ වෙතට පැමිණ, උන් වහන්සෙගේ ශ්‍රාවකයන්ගෙන් සමහරුන්, අපවිත්‍ර අත්වලින්, එනම්, චත්පිළිවෙත් අනුව අත් නොසෝදා, කෑම කනවා දුටුවෝ ය. පරිසිවරුත්, සියලු ජුදෙව්වරුත් පරම්පරාගත සම්ප්‍රදායයන් පිළිපදින බැවින් චත්පිළිවෙත් අනුව අත් සෝදාගෙන මිස කෑම නොකන්නෝ ය. වෙළෙඳ පොළේ සිට ආ විට, ධෝවනය නිමවා මිස, ඔව්හු කෑමට නොයති. ඔවුන් පිළිපැදීමට බැඳී සිටින තවත් බොහෝ සම්ප්‍රදායයන් ඇත. එනම්, පිඟන්, කළගෙඩි සහ ලෝකඩ හැළිවළං සේදීම ය. පරිසිවරු ද විනයධරයෝ ද උන් වහන්සේ අමතා, "ඔබේ ශ්‍රාවකයන් පරම්පරාගත සම්ප්‍රදාය අනුව නොහැසිර, චත්පිළිවෙත් අනුව අත් නොසෝදා කෑම කන්නේ මන්දැ"යි ඇසූ හ. උන්වහන්සේ පිළිතුරු දෙමින්, "කෛරාටිකයෙනි, ශුද්ධ ලියවිල්ලේ ලියා ඇති ලෙස, ඔබ ගැන යෙසායා කී මේ දිවැස් වැකිය මැනවින් ඔබට ගැළපේ: 'මුවින් මේ සෙනඟ මට ගරු කරති; සිතින් නම් මගෙන් දුරු ව සිටිති. මිනිස් ඔවා, දෙව් දහම් ලෙස උගන්වා නිසරු ලෙස මා නමදිති.' ඔබ දෙවියන් වහන්සේගේ ආඥාව ඉවත ලා, මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායයන් පිළිපදින්නහු ය"යි වදාළ සේක. උන් වහන්සේ යළිත් සමූහයා තමන් වෙතට කැඳවා, "ඔබ හැම මට සවන් දී තේරුම්ගන්න. පිටතින් මිනිසා තුළට පිවිස ඔහු කෙලෙසිය හැකි, කිසි දෙයක් නැත. මිනිසා තුළින් නික්මෙන දෙයින් ඔහු කෙලෙසනු ලබයි. ඇතුළතින්, එනම්, මිනිස් හදවතින්, නපුරු චේතනා, කාම රාග, සොරකම්, මිනී මැරුම්, සල්ලාලකම්, තණ්හා, දුෂ්ටකම්, වංචා, හිරි ඔතප් නැති බව, ඊර්ෂ්‍යාව, අපහාසය, අහංකාරය සහ මෝහය නික්මෙයි. මෙකී සියලු නපුරු දේ ඇතුළතින් නික්ම ඒවායින් මිනිසා කෙලෙසනු ලැබේ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.